**18-06-2022 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, උපත් 21ක් උදෙසා ඔබට ස්වාධිකාරීත්වය නම් වූ තිලකය ලබා ගැනීමට අවශ්‍ය නම්, ශරීරය කෙරෙහි ඇති සියලු ආකල්පත් සියලු ශරීර අවධානයත් අමතක කර ඒ එකම එක පියා පමණක් සිහිපත් කරන්න.

**ප්‍රශ්නය:** දරුවන්ගේ සාමාන්‍ය දැනීම අතින් ගත් කල පියා සතුටු වන කරුණ කුමක්ද, එවන් වූ දරුවන්ට පියා විසින් දෙනු ලබන උපදේශය කුමක්ද?

**පිළිතුර:** කිසිම වටිනාකමකින් තොර වූ තමා ළඟ ඇති සියලු දේ සේවය වෙනුවෙන් යොදවා ඒවා ප්‍රයෝජනවත් ලෙස පාවිච්චි කර උපත් 21ක් උදෙසා තමාගේ අනාගත වාසනාව වෙනුවෙන් යමක් එකතු කර ගන්නා දිළිඳු දරුවන්ගේ සාමාන්‍ය දැනීම දෙස බලා බාප්දාදා බොහෝ සතුටට පත් වෙනවා. එවන් වූ දරුවන්ට පියා පළමුවන පන්තියේ උපදේශයක් දෙනවා: දරුවනි, භාරකරුවන් බවට පත් වන්න. කිසිම දෙයක් තමාට අයිති වන්නක් ලෙස සිතන්න එපා. භාරකරුවන් ලෙස තම දරුවන් පවා රැකබලා ගන්න. ඥානය මඟින් ඔබගේ ජීවිත අභිවෘද්ධියකට නංවමින් රජවරුන්ගෙත් රජවරුන් බවට පත් වන්න.

**ගීතය:** මම මාගේ වාසනාව අවදි කරමින් පැමිණ සිටිමි...

ඕම් ශාන්ති. දරුවන්ට වචන දෙකක් ඇසුනා. තමා දැන් නව ලෝකය නම් වූ තම වාසනාව උදා කර ගනිමින් පැමිණ සිටිනා බව දරුවන්ට දැන් වැටහෙනවා. තම වාසනාව උදාකර ගැනීම උදෙසා ඔබ උත්සාහ දැරිය යුතු වනවා. මෙහිදී දරුවන් වන ඔබ ශ්‍රීමත් ලබනා බව ඔබ දන්නවා. ඔබට ඒ උසස්ම වූ මන්ත්‍රය වන "මන්මනභාව්" යන්න මෙහිදී ලැබෙනවා. එම කියමන සාමාන්‍යයෙන් තිබෙනවා. මෙම මන්ත්‍රය ඔබට දෙන්නේ කවුද? උසස්ම වූ තැනැත්තා ඔහු වන අතර උපදෙසක් දීමේදී එහි සාගරය වන්නේත් ඔහුයි. ඔහුගෙන් ඔබ උපදෙස් ලබන්නේ එකම එක අවස්ථාවකදී පමණයි. නාටකයේ යමක් සිදු වූ පසු නැවතත් අවුරුදු 5000කින් පසුව එය සිදුවෙනවා. මේ එකම එක උසස් වූ මන්ත්‍රය නිසා ඔබගේ ඔරුව ඔබට එගොඩ කරගත හැකි වනවා. ඒ පාරිශුද්ධකරුවා වූ පියා ඔබට ශ්‍රීමත් ලබා දීමට මෙහි එන්නේ එකම එක අවස්ථාවකදී පමණයි. පාරිශුද්ධකරුවා කියන්නේ කවුද? ඒ උත්තරීතර පියා, උත්තරීතර ජීවය පමණයි ඔබව පාරිශුද්ධත්වයට පත් කොට ඔබව ඒ පාරිශුද්ධත්වයේ ලෝකය වෙත ගෙන යන්නේ. පාරිශුද්ධකරුවා හා විමුක්ති දායකයා ලෙස හැඳින්වෙන්නේ ඔහුම පමණයි. ඔබ අසුන්ගෙන ඉන්නේ ඔහු ඉදිරියේයි. ඔබගේ මුලු ලොවම ඔහු බව ඔබ දන්නවා. ඔබගේ වාසනාව උසස්ම වූ වාසනාව බවට පත් කරන්නාත් ඔහුමයි. ඒ අසීමිත වූ පියාගෙන් තමා මෙම උසස් වූ මන්ත්‍රය ලබනා බව ඔබ දන්නවා. ඔහු තමා පියා. එහෙම නේද? එක්කෙනෙක් අශරීරිකයි අනෙක් කෙනා භෞතිකයි. දරුවන් වන ඔබ ඔහුව සිහිපත් කරනා අතර පියාත් ඔබව සිහිපත් කරනවා. සෑම චක්‍රයකදීම ඔහු මේ සෑම දෙයක්ම ඔබට කියනවා. පියා කියනවා: සෑමගේම ගැලවීම උදෙසා තිබෙන්නේ එකම එක මන්ත්‍රයයි. ඒ වගේම ඒ ඒකායන තැනැත්තා පමණයි ඔබට එය ලබා දෙන්නේ. සත්‍යයේ මන්ත්‍රය ඔබට කියා දෙන්නේ සත්ගුරු පමණයි. තමා මෙහි පැමිණ සිටින්නේ, ඔබගේ ඒ සතුටේ දේශයෙහි වාසනාව උදාකර ගැනීම උදෙසා බව ඔබ දන්නවා. ස්වර්ණමය යුගය හඳුන්වන්නේ සතුටේ දේශය ලෙසයි. මෙය දුක් සහිත දේශයයි. ශිව බාබා, බ්‍රහ්මින් දරුවන් බවට පත් වන අයට බ්‍රහ්මාගේ මුඛය මාර්ගයෙන් මන්ත්‍රයක් දෙනවා. ඔහු අනිවාර්යෙන්ම භෞතික ස්වරූපයක් තුළට ඇතුළු විය යුතුයි. ඔහු වෙන කොහොම ඔබට මෙය ලබා දෙන්නද? ඔහු කියනවා: සෑම චක්‍රයකදීම මා ඔබට මේ උසස් වූ මන්ත්‍රය කියා දෙනවා, නිරන්තරයෙන්ම මා පමණක් සිහිපත් කරන්න. ශරීර ධර්මතා සියල්ල ඉවත්කර දමන්න. ඔබගේ ශරීරයත් ඊට අයත් සියලු සබඳතාත් අමතක කර දමන්න. තමා ශරීරයක් ලෙස සැලකීමෙන් ඔබ ශරීරයට අයත් සියලු සබඳතා, එනම්, ඔබගේ මාමලා, බාප්පලා සැවොම ගැන සිහිපත් කරමින් ඉන්නවා. මිනිස්සු කියනවා: ඔබ මියගිය කළ මුලු ලොවම ඔබට මියගියා හා සමානයි. පියා කියනවා: මමත් ඔබට එවන් වූ මන්ත්‍රයක් දෙනවා. තමා ජීවාත්මයක් ලෙස සලකා අශරීරිකත්වයට පත් වන්න. ශරීරය ගැන වූ සියලු ආකල්ප ඉවත් කර දමන්න. මෙහිදී ඔබ ශරීර අවධානයෙන් සිටිනා නමුත් ස්වර්ණමය යුගයේ දී ඔබ ඉන්නේ ජීවාත්ම අවධානයෙන්. මේ සංගම යුගයේ දී ඔබ ජීවාත්ම අවධානයට පත් වන අතර ඔබ පරමාත්ම දෙවියන් ගැනත් දැන ගන්නවා. ඔබ දේවවාදීන් බවට පත් වෙනවා. උත්තරීතර පියා, උත්තරීතර ජීවය හා ඔහුගේ නිර්මාණය ගැන දන්නා අය දේවවාදීන් බවට පත්

වෙනවා. කලි යුගයේ හෝ සත්යුගයේ හෝ කිසිම තැනක දේවවාදීන් නැත. සංගම යුගයේ දී ඔබ තම පියාගෙන් ඔබගේ උරුමය ලබාගෙන පසුව සත්යුගයේ පාලනය ගෙන යනවා. ඔබ දේවවාදීන් හා අදේවවාදීන් ගැන කතා කරන්නේ මෙහිදීයි. එහි මෙවැනි දේවල් නැහැ. මුලදී දේවවාදීන් වූ බ්‍රහ්මින්වරු දැන් අදේවවාදීන් බවට පත් වෙනවා. මේ කාලයේ මුළු ලෝකයම අදේවවාදීන්ගෙන් පිරිලා. කිසිම කෙනෙක් තම පියා හෝ ඔහුගේ නිර්මාණය ගැන දන්නේ නැහැ. ඔහු සෑම තැනකම සිටිනා බව ඔවුන් කියනවා. දරුවන්ව සැළකෙන්නේ ඒ අසීමිත වූ පියාත් සමඟ පමණයි. ඔබට ඔහුගේ ශ්‍රීමත් ලැබෙනවා. එනම්, ඔහු ඔබව උත්සාහ දැරීමට පොළඹවනවා. ඔහු කියනවා: දරුවනි තම ශරීරයත් ශරීර අවධානයත් අමතක කරන්න. වෙන කිසිම කෙනෙක් සිහිකරන්න එපා. තමා ජීවාත්මයක් ලෙස සලකා ඔබගේ පරමාත්ම පියා වූ මා සිහිපත් කරන්න. මෙය තමයි ඔබගේ වාසනාව නිර්මාණය වන්නා වූ එකම උසස් වූ මන්ත්‍රය. ඔබ උපත් 21ක් උදෙසා ස්වාධිකාරීත්වය නම් වූ තිලකය හිමිකර ගන්නවා. තිළිණය වන්නේ එයයි. ගීතාව තිබෙන්නේ සාමාන්‍ය මනුෂ්‍යයෙකුගෙන් නාරායන බවට එනම්, මනුෂ්‍ය තත්ත්වයෙන් දේවත්වයට පත් වීම සඳහාය. මෙම ලෝකය වෙනස් වන බව දරුවන් දන්නවා. ඔබ ඒ නව ලෝකය වෙනුවෙන් ඔබගේ වාසනාව උදාකර ගන්නවා. මරණයේ දේශය මෙයයි. මෙහි මිනිසුන්ගේ වාසනාව කුමක්ද කියා බලන්න. එය හඳුන්වන්නේ දුකින් පිරි දේශයක් ලෙසයි. මෙසේ කිව්වේ කවුද? මෙසේ කිව්වේ ජීවාත්මයයි. ඔබ දැන් ජීව අවධානයට පත් වෙනවා. ජීවාත්මය කියනවා: මෙය දුකින් පිරි දේශයයි. අපගේ උත්තරීතර දේශය වන්නේ බාබා වාසය කරනා ස්ථානයයි. පරම පියා දැන් අපට ඥානය ලබා දී අපගේ වාසනාව උදාකර දෙනවා. පියා ඒ උසස්ම වූ එකම මන්ත්‍රය අපට කියා දෙනවා. මා සිහිපත් කරන්න. ඔබ එය ශාරීරික අයෙකුගෙන් සවන් දුන්නාට කමක් නැහැ. නමුත් අශරීරික තැනැත්තා වූ මා සිහිපත් කරන්න. ඔහුට ඇහුම්කන් දීමට ඔබ ශාරීරික වූ කෙනෙක් හරහාම සවන් දිය යුතු වෙනවා. බ්‍රහ්ම කුමරුන් හා බ්‍රහ්ම කුමරියන් පවා තම කටින් මෙසේ පැවසිය යුතු වෙනවා: පාරිශුද්ධකරුවා සිහිපත් කරන්න. ඔබ තම හිසෙහි ඇති සියලු පාප බර පුළුස්සා දැමිය යුතු වන්නේ ස්මරණය මඟින්ම පමණයි. ඔබ අසනීප වලින් නිදහස් විය යුතුමයි. දරුවන් පියා ඉදිරියේ අසුන්ගෙන සිටිනවා. බාබා ඔබගේ වාසනාව උදාකර දෙන බවත් ඔහු ඔබට ඉතාමත් පහසු වූ මාර්ගයක් පෙන්වා දෙන බවත් ඔබ දන්නවා. ඔබ කියනවා: බාබා, අපට ඔබව මතක් කිරීමට අමතක වෙනවා. මේ ගැන ඔබට ලැජ්ජා නැතිද? ඔබව අපිරිසිදු කරනා භෞතික පියා සිහි කිරීමට ඔබට පුළුවන්. කොහොමනමුත්, මෙලොවින් ඔබ්බෙහි සිටින්නා වූ ඔබව පාරිශුද්ධත්වයට පත් කරමින් තමාව නිරන්තරයෙන් ම සිහිපත් කිරීමෙන් ඔබගේ පාප නැති වී යයි පවසන පියාව ගැන ඔබ කියන්නේ ඔබට ඔහු අමතක වී යන බවයි. පියා කියනවා: මා පැමිණ සිටින්නේ ඔබව කෝවිලක වාසය කිරීමට තරම් පාරිශුද්ධත්වයට පත් කිරීම උදෙසාය. භාරතය ශිව කෝවිලක් වූ බව ඔබ දන්නවා. අප එහි පාලනය ද ගෙන ගිය අතර ඔවුන් ශිව කෝවිල් වල අපගේ පිළිම වලට වන්දනා කරමින් සිටියා. තමා දේවතාවන්ව සිටි බව ඔබට දැන් අමතක වී ගොසිනි. ඔබේ මමා හා බාබා වන්දනීයත්වයට සුදුස්සන්ව සිට වන්දනාකරුවන් බවට පත් වූවා. ඔබ බුද්ධිය තුළ දැන් මෙම ඥානය තිබෙනවා. කල්ප වෘක්ෂයේ පිංතූරයෙහි ප්‍රධානම අයව පෙන්නුම් කර තිබෙනවා: මුලදීම පදනමෙහි මුලෙහි, ඒ ආදී සනාතන දේවි දේවතාවන් සිටි නමුත් ඔවුන් තව දුරටත් එහි නැහැ. මීට අවුරුදු 5000කට ප්‍රථම ස්වර්ණමය යුගය තිබුණු නමුත් දැන් එය කළි යුගයයි. කලි යුගයෙන් පසු සත් යුගය පැමිණිය යුතුමයි. සත්‍ය ලෙසම ඒ ශ්‍රීමත් ලබා දෙන තැනැත්තා පැමිණිය යුතුමයි. සත්‍ය ලෙසම ලෝකය වෙනස් විය යුතුමයි. ඔවුන් නොයෙකුත් නම් හා ස්වරූපයන්ට ගොදුරු වෙනවා. පියා කියනවා: එසේ ගොදුරු වන්න එපා. ඔබට තම පවුලේ අයත් සමඟ ජීවත් විය හැකියි. නමුත් පියා සිහි කරමින් පාරිශුද්ධත්වයෙන් ඉන්න. දෙවියන් කතා කරයි: ඔබගේ ලොකුම සතුරා රාගයයි. මුලදීත් ගීතාවේ දෙවියන් මෙසේ පැවසූ අතර ඔහු දැන් නැවතත් එය කියනවා. ගීතාවේ දෙවියන් අනිවාර්යෙන්ම ඔබට රාගය පරාජය කිරීමට සලසනවා. එකක් රාවණ්ගේ රාජ්‍යය වන අතර අනෙක රාමාගේ රාජ්‍යයයි. රමාගේ රාජ්‍යය දහවල වන අතර රාවණ්ගේ රාජ්‍යය රාත්‍රියයි. පියා කියනවා: මේ රාවණ්ගේ රාජ්‍යය දැන් විනාශ වීමටයි තිබෙන්නේ. ඒ සඳහා සියලු සූදානම් කිරීම සිදු වෙමින් පවතිනවා. පියා ඔබට උගන්වා ඔබව නැවතත් ගෙන යන අතර පසුව ඔබ පාලන බලය ලබා ගන්නවා. ඔබ මේ අපිරිසිඳු ලෝකය පාලනය කරන්න යන්නේ නැහැ. ශිව බාබාට මෙහි පය ගහන්න ඔහුට පාද නැහැ. දේවතාවන්ට මේ අපිරිසිඳු ලෝකය මත පය ගහන්න බැහැ. තමා දැන් දේවත්වයට පත් වන බවත් පසුව ඔබ භාරතයට පැමිණෙන බවත් ඔබ දන්නවා. කොහොමනමුත්, ලෝකය කලි යුග තත්ත්වයෙන් ස්වර්ණමය යුගය බවට පත් වෙනවා. ඔබ දැන් උසස් තත්ත්වයට පත්වෙනවා. බොහෝ දරුවන් කියනවා: බාබා, මා වෙත නොයෙකුත් කුණාටු එනවා. පියා කියනවා: ඔබට පියා සිහි කිරීමට අමතක වෙනවා. ඔබ දැන් පිළිපදින්නේ පියා විසින් දෙනු ලබන උපදේශයයි. ඔබට ලැබෙන්නේ උසස්ම වූ පියාගේ උපදේශයයි. දරුවනි, දූෂණය වන්න එපා. ඔබට උගන්වන්නේ මේ

ඒකායන තැනැත්තා පමණයි. ඔහු කියනවා: නිරන්තරයෙන්ම මා පමණක් සිහිපත් කරන්න. ඔහුගේ වාහනයවත් සිහිකරන්න එපා. වාහනය මෙන්ම එම වාහනය තුළ අසුන්ගෙන සිටිනා තැනැත්තාත් සිටිනවා. එය අශ්ව කරත්තයක් පිළිබඳ වූ දෙයක් නොවේ. කෙනෙක් ඒ තුළ ඉඳගෙන ඥානය දෙයිද? මේ දවස්වල මිනිස්සු ගුවන් යානයෙන් සංචාරය කරනවා. දැන් විද්‍යාව ඉතා බලවත්. මායාගේ ආටෝපයත් ඉතා බලවත්. මේ දිනවල මිනිස්සුන්ට බොහෝ සෙයින් ගෞරව දැක්වීම් සිදුවෙනවා. අහවල් අහවල් රටින් පැමිණි අගමැති මෙහි පැමිණි බවත් ඔහුට බොහෝ ගෞරව දැක්වුනු බවත් කියනවා. දින 15කින් පසු ඔහුව සිංහාසනයෙන් පහ කරනු ලබනවා. අධිරාජ්‍යයින් පවා බොහෝ අපහසුතාවන්ට ලක් වනවා. ඔවුන් ඉන්නේ සැඟෙන බයකින්. ඔබට ඉතාමත් පහසුවෙන් ඥානය ලැබෙනවා. ඔබ ඉතා දිළිඳුයි. ඔබ ළඟ සතයක් වත් නැහැ. ඔබ බාබා ඔබගේ භාරකරුවා බවට පත් කර මෙසේ කියනවා: බාබා, මේ සෑම දෙයක්ම ඔබගෙයි. බාබා කියනවා: අච්චා, ඔබත් භාරකරුවෙක් බවට පත් විය යුතුයි. ඔබ එය තමන්ගේ දෙයක් ලෙස සැලකුවහොත් එය ඥානවන්තකම නොවේ. ඔබ ශ්‍රීමත් අනුගමනය කළ යුතුමයි. භාරකරුවන් වන අය ශ්‍රීමත් අනුගමනය කරනවා. ඔබ දිළිඳුයි. ඉතින් තමා ළඟ ඇති සතයක්වත් නොවටිනා සියලු දේ බාබාට දිය යුතු යැයි ඔබට හැඟෙනවා. බාබා එවිට ඔබට පළමු පන්තියේ උපදේශයක් දෙනවා. ඔබ තමාගේ දරුවන්වත් රැකබලා ගත යුතුයි. ඔබ දැන් තමාගේ වාසනාව උදාකර ගන්නා වූ මෙම ඥානය, පසුව ඔබ රජවරුන්ගෙත් රජවරුන් බවට පත් වන්නා වූ මෙම ඥානය ලබා ගන්නවා. ඔබට උපදෙස් ලබා දීම පියාගේත් කාර්යයයි. පියා සිහිපත් කරන්න. කෙනෙක් වළට වැටීමට යනවා නම් ඔහුව ඉන් ආරක්ෂා කර ගැනීමේ අනුකම්පාව ඔබ තුළ හටගත යුතුයි. දැඩි උපක්‍රමශීලීත්වයකින් යුතුව ඔබ ඉදිරියට යා යුතුයි. සුප්නාකා, පුත්නා, අජාමිල්, දුර්යෝදන් ආදී සියලු නම් අදාළ වන්නේ මේ කාලයටයි. කල්පයකින් පසු මෙකල සිදුවන සෑම දෙයක්ම නැවතත් සිදු වෙනවා. ඒ පියාම පෞද්ගලිකවම පැමිණ ඔබට ඥානය ලබා දෙනවා. ඔහු ඔබට මනුෂ්‍ය තත්ත්වයෙන් දේව තත්ත්වය ලබා ගැනීමට සලස්වනවා. ඔබ මෙහි පැමිණ සිටින්නේ මීට අවුරුදු 5000කට ප්‍රථම ලැබූ අයුරින්ම ඔබගේ උරුමය ලබා ගැනීම උදෙසාය. මුලදීත් ඒ විශාල යුද්ධය සිදු වූවා. එය මේ සමඟ සම්බන්ධ වූවකි. පියා සෑම දෙයක්ම ඔබට ඉතා පැහැදිලි ලෙස විස්තර කරමින් මනුෂ්‍ය තත්ත්වයෙන් දේවත්වය ලැබීමට ඔබව සූදානම් කරනවා. ඔබ මෙහි පැමිණ සිටින්නේ පියාගෙන් ඔබගේ උරුමය ලබා ගැනීම උදෙසාය. බ්‍රහ්මාගෙන්, ජගදම්බාගෙන් හෝ බී.කේ. අයගෙන් ඔබ උරුමයක් ලැබීමට යන්නේ නැහැ. ඔවුනුත් තම උරුමය හිමිකර ගන්නේ පියාගෙනි. අන් අයටත් ඔබ විස්තර කළ යුතුයි. ඔබත් ජගත් පියාගේ දරුවන් බවට පත් වී ඔහුගෙන් තම උරුමය හිමිකර ගන්නවා. ඔහු පෞද්ගලික ලෙසම සෑම දෙයක්ම කියා දෙනවා: දරුවනි, මා සිහිපත් කරන්න. මෙම ඊ තලය කෙලින්ම වදින්නකි. පියා කියනවා: දරුවනි, ඔබ මගෙන් ඔබගේ උරුමය හිමිකර ගත යුතුමයි. ඔබගේ නෑ හිත මිතුරන් මිය ගියත් පියාගෙන් ඔබ තම උරුමය හිමි කර ගත යුතුමයි. මේ පිළිබඳව ඔබ තුළ දැඩි සතුටක් තිබිය යුතුයි. ඔබ දන්නවා ඔබ මෙහි පැමිණ සිටින්නේ ඔබගේ වාසනාව උදාකර ගැනීමට බව. බාබා දැන් නැවතත් ඔබව සත් යුගයේ පාලකයන් බවට පත් කරවනා බව ඔබ දන්නවා. එමනිසා, ඔබ එම ගති පැවතුම් ඇති කර ගත යුතුම වෙනවා. පාප වලින් ඔබව ආරක්ෂා කර ගන්න. අප පාරිශුද්ධත්වයටත් පාපයෙන් තොර තත්ත්වයටත් පත් වනවා. ඔබ නාටකයත් කල්ප වෘක්ෂයත් ගැන තේරුම්ගත යුතුයි. මෙහි වෙන කිසිම අපහසු කාර්යයක් නැහැ. සරළම දෙය මෙයයි. නමුත්, ඒ වෙනුවට ඔබ කියනවා: බාබා, මට ඔබ අමතක වනවා. භූතාත්මයක් මා තුළට පැමිණියා. බාබා කියනවා: ඒ භූතාත්මය ඉවත් කර දමන්න. ඔබගේ හදවත නම් වූ කැඩපතින් තමා සුදුස්සෙක් බවට පත්ව තිබෙනවාද කියා බලන්න. ඔබ සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන බවට පත් විය යුතුමයි. පියා මෙහි අසුන්ගෙන විස්තර කරනවා: සුමිහිරි වූ වාසනාවත් දරුවනි, ඔබ මෙහි පැමිණ සිටින්නේ වාසනාවන්ත වීමටයි. දැන් සෑම කෙනෙක්ම අවාසනාවත් තත්ත්වයට පත්ව සිටිනවා. භාරතයේ මිනිස්සු ඉතා වාසනාවත් වූ අතර ඔවුන් බොහෝ ධනවත් ද වූවා. මේ සියල්ලම භාරතය පිළිබඳ වූවකි. පියා කියනවා: තමා ජීවාත්මයක් ලෙස සලකන්න. මන්ද, ඔබ මා ළඟට පැමිණිය යුතුමයි. එමනිසා, ඔබගේ අවසාන සිතිවිලි අනුව ඔබගේ දෛවයත් නිර්මාණය වෙනවා. මෙම නාට්‍යය දැන් අවසන් වීමට ළඟයි. අප දැන් නිවස වෙත යාමටයි ඉන්නේ. බාබාත් ඔබට ඒ වෙත වූ මාර්ගය පෙන්වා දෙනවා. ඔබ තමාගේ සියලු පාප වලින් නිදහස් වී පුණ්‍යවත් ජීවයක් බවට පත් වනු ඇත. පිරිසිදු පුණ්‍යවත් ජීවයන්ගෙන් යුතු වූ ලෝකයක් තිබුණු අතර එය දැන් නැවතත් ස්ථාපනය වීමටයි තිබෙන්නේ. පැරණි ලෝකය වෙනස් වී නව ලෝකයක් බවට පත් විය යුතුමයි. පෞරාණික වූ භාරතය තිබෙනා කල එය දිව්‍යලෝකයක් වූ බව ඔබ දන්නවා. දිව්‍යලෝක දෙවියන් පියා තමයි දිව්‍යලෝකය නිර්මාණය කළේ. ඔහු පැමිණියේ කවදාද? ඔහු එන්නේ මේ කාලයේ දී පමණයි. මෙය ඒ සියල්ලන්ටම හිතවතා වූ පියා එන අවස්ථාව ලෙස හැඳින්වෙනවා. රාවණ්ගේ සමාජය ඉතා විශාල වන අතර රාමාගේ සමාජය ඉතාමත් කුඩායි. මෙහිදී ඔබගේ සංඛ්‍යාව දිගින් දිගටම

වර්ධනය වෙනවා. දරුවන් නැවතත් වතාවක් නොකඩවාම පියාගෙන් තම උරුමය හිමිකර ගන්නවා. ප්‍රදර්ශන හා ප්‍රක්ෂේපණ යන්ත්‍ර මඟින් ඔබ නොකඩවාම විස්තර කරනවා. තවමත් සැහෙන සේවයක් කිරීමට ඔබට ඉතිරි වී තිබෙනවා. පියා නොකඩවාම මෙසේ කියනවා: ආදරණීය දරුවනි, මෙය නාටකයයි. කොහොමනමුත්, මේ වන තෙක් ඔබ පත්ව ඇති තත්ත්වය තමයි නිවැරදි නාටකය ලෙස හැඳින්වෙන්නේ. පියා කියනවා: මගේ කොටස පවා නාටකය අනුව එලෙසින්ම නිර්මිත වී තිබෙන්නකි. දරුවනි, මා පවා මේ අපිරිසිදු ලෝකය තුළට ඇතුළු විය යුතුයි. මා ඒ උත්තරීතර දනව්ව අත්හැර දරුවන් වෙනුවෙන් මෙහි එන ආකාරය දෙස බලන්න. වසංගත තිබෙනා විට වෛද්‍යවරුන් ලෙඩුන් අතරින් පලා යන්නේ නැහැ. ඔවුන් පැමිණිය යුතුමයි. මිනිස්සු ගායනා කරනවා: අහෝ පාරිශුද්ධකරුවාණනි, එන්න. පැමිණ අපව පාප පහෙන් මුදවා ගන්න. අප පාරිශුද්ධත්වයට පත් කර අපව නිදහස් කරන්න. දුකින් පිරි දේශයෙන් මුදවාගෙන අපව සතුටේ දේශය වෙත ගෙන යන්න. විමුක්තිදායකයා වන්නේ පරමාත්ම දෙවියන්ය. සැමගේම විමුක්තිදායකයා ඔහු වන අතර ඔහු සැමගේම මාර්ගෝපදේශකයා ද බවට පත් වී සැම කෙනෙක්වම නැවතත් ගෙන යනවා. පසුව අනුපිළිවෙලින් යුතුව ඔබ නැවත පහළට එනවා. සූර්ය වංශික, චන්ද්‍ර වංශික තත්ත්ව ලබා පසුව තඹ යුගයේදී ඔබ වන්දනා කරුවන් බවට පත් වෙනවා. දේවතාවන් පාප මාර්ගයට ඇද වැටුණු බව කියැවෙනවා. ඔවුන් පාප මාර්ගයේ පිළිම පවා පෙන්නුම් කරනවා. තමා දේවතාවන්ව සිටි බව ඔබට දැන් වැටහෙනවා. මේවා ඔබට තේරුම් ගත හැකි ඉතාමත් පහසු වූ කරුණු. තම බුද්ධිය තුළ ඉතා හොඳින් මෙම කරුණු ධාරණය කර ගන්න. දැන් මෙහි පැමිණ සිටින්නේ ඔබගේ වාසනාව උදාකර ගැනීමටයි. මෙහිදී පියා පෞද්ගලික ලෙසම අසුන්ගෙන සිටිනවා. කොහොමනමුත්, ගුරුවරුන්ගේ අනුපිළිවෙලක් තිබෙනවා. දෙවියන් මෙහිදී සියලු ජනයාගේ පියා වූ බ්‍රහ්මාගේ මුඛයේ ආධාරයෙන් සියලු වේද හා ආගමික ග්‍රන්ථයන්හි සාරය ඔබට විස්තර කරදී තිබෙනවා. ඔහුට පළමුවෙන්ම සවන් දෙන්නේ බ්‍රහ්මායි. ඔවුන් සූක්ෂම ලෝකයේ බ්‍රහ්මා, විෂ්ණු හා ශංකර් ව පෙන්නුම් කර තිබෙනවා. බ්‍රහ්මින්වරුන් දේවතාවන් බවට පත් වන මෙම අවස්ථාවේදී බ්‍රහ්මා අවශ්‍ය වෙනවා. මෙය තමයි රුද්‍රාගේ දැනුම නම් වූ යාගය. මුලදීත් මෙවැනි යාගයක් නිර්මාණය වුවා. අනෙක් සියලු යාගද මෙම යාගයේම බිලිවන අතර සැම දෙයක්ම විනාශ වී යනවා. පසුව, දරුවන් වන ඔබ නව ලොව පාලනය ගෙන යනවා. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ තුළ ඇති සියලු යක්ෂාත්ම ඉවත් කර දමා සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන බවට පත් වීමට සුදුස්සෙක් බවට පත් වන්න. තම හදවත නම් වූ කැඩපතින් බලා තමා කෙතරම් දුරට ඒ සඳහා සුදුස්සෙක් වී ඇත්දැයි පරීක්ෂා කර බලන්න.
2. තමා ජීවාත්ම ලෙස සලකා, අශරීරිකත්වයට පත් වී පියා සිහිපත් කරන්න. ශරීරය ගැන කිසිම අවධානයක් ඇති කර නොගැනීමට පුහුණු කරන්න.

**වරදානය:** සතුටු හදවතක් සහිත උද්යෝගිමත් බවෙන් සිටින ඔබ සදා ඔබේ පාරිශුද්ධියේ රාජකීයත්වයෙන් ප්‍රීතිමත්වී සිටිත්වා.

රාජකීයත්වය ඇති ජීවාත්මයන් එනම්, පාරිශුද්ධියේ යථාර්තය වූ සදා සතුටින් නර්තනය කරන්නන්ය. ඔවුන්ගේ සතුට ඇතැම් විටෙක අඩුවේ. දිනෙන් දින, ඔවුන්ගේ සතුට නොකඩවා සැම මොහොතේම වැඩිවෙමින් පවතී. ඔවුන්ගේ අභ්‍යන්තරයේ එක් දෙයක් සහ බාහිර තවත් දෙයක් නොතිබේ. ඔවුන්ගේ ආකල්පයෙහි, දැක්මෙහි, වචනයෙහි සහ හැසිරීමෙහි සත්‍යවාදී වෙති. එවන් නියම රාජකීය ජීවාත්මයන් තම හදවතින්, දැක්මෙන්, සහ හැඩරුවෙන් නිරන්තරව සතුටින් සිටින්නන් වේ. ඔවුන් සදාතනිකව සතුටු හදවත් ඇතිව ප්‍රීතිමත්ව සිටිති.

**පාඨය:** ලොවෙහි වඩාත් උසස් බලය වන්නේ පාරිශුද්ධත්වයේ බලයයි.

***** ඕම් ශාන්ති *****